# රට ගිය අය්යාට

අතුල විජේවික්‍රම

අයියේ මතකද අපි දුව පැන නැටුවා
අම්මා වැඩියෙන් කිරි දී නුඹ හැදුවා
අප්පච්චී නුඹ ගිය දා ඉකි ගැසුවා
අක්කා ගෙයි මුල්ලේ කවුරුත් නැතුවා

කුසගින්දර ඉහිලුවේ නුඹ වඩන්නයි
පාසැල වැසුනේ නුඹ නැණ පාදන්නයි
බැල මෙහෙවරකම් කෙරුවේ රැකගන්නයි
දහදුක් වින්දේ නුඹ රජ කරවන්නයි

අපි පසුබැස්සේ නුඹ පස්සේ එන්නයි
නුඹ සිරකෙරුවේ අපෙ පරපුරේ සුසුමයි
මව්බිම හැරලා උගතුන් රට යන්නයි
අසරණයින් දස දහසින් උපදින්නයි

පහන් වැට

## මතකද ඔබට මා

පාලුව තනිකම අවුදින් මා වෙලාගද්දි
නොසන්සුමට රජදහනකි මගෙ හිත
කුමක් කළත් නෑ ඉන් මිදෙන්න හැකි
අතීතයට දුව ගියා හිත මගේ
ඔබට මෙසේ අමතා මතකද ඔබට මා
උතුරේ භීෂන සමයේ අප හමුවූවා

**ශ්‍රියානි**
ජර්මනිය

# ආගන්තුකයෙක්



පියවර මනිම් දොල මං පෙත තුරු වදුලේ
හිස් වී ඇත දෙපස කිසිවෙකු නැත ගෙපැලේ
ගරා වැටුනු රිය සක සැතපෙයි මිදුලේ
මොහොතක් තටු සලයි මතකය මගෙ බාලේ

මල හිරු වැටුනු තුරු මුදුනින් ඉගිල යන
විහඟුන් හඬ බිඳලයි සැනෙකට දැහැන
පීරා බලමි නෙත අබියස වන් යොදුන
නැත මග සලකුණක් මගෙ මතකයෙ රැඳුන

විදුලිය පහන් කඩමන්ඩිය එලිය කර
පලවා හරී ගම බිම සතපන අඳුර
එබිකම් කළද මග යන එන දන අතර
නැත මුන ගැසෙනු කිසිවෙකු දැක පුරුදු පෙර

ඉර හඳ නැගී බැස යන මුදු වෙනදා මෙන්
ඇල දොල ගලා හැලූනද වැව් අමුණු මතින්
උරුමය නොරැක දුරු රට පිය මං වු පවින්
ගම අද බලයි මා දෙස නාඳුනන ඇසින්

**ප්‍රේමවංස දසනායක**
ඇල්ටෝනා, වික්ටෝරියා.

# නුඹේ යෙහෙළියගෙ කියඹුව

**ඉසුරු අබේසේකර**



මට මතකයි නුඹේ
යෙහෙළියගෙ කියඹුව
කෙටිව වුව කිටි කිටිව
බැඳුණු වරලේ ලූහුව
දිගැටි නළලේ පසෙක
බිම බලන් ඇද හැලූණු
සුළඟ හා හාද වුණු
ඇගෙ හැඩැති කියඹුව

හදිසියේ මේ අසා
සිහිව "සැබවකි( ආ.."
සිතුවාද කෙතරම්
චපලයෙකුදෝ මං?

ඇසිල්ලක් නවතින්න..

මට මතකයි නුඹේ යෙහෙළියගෙ කියඹුවත්

# Black

Asanki Ranaweera



'Black' it is
with shiny diamonds above
and bright green stars around
I feel lost
and fail to find Venus or the evening star
winds blow a secret in my ear
I close my eyes and listen
to the music composed by emptiness
lyrics written by river Yarra
song sung by breeze
about a rainbow-bridge
that linked desolation with pleasure
a sensation of a sincere hand
softly tangling with mine
I open my eyes
and treasure the evening star
right next to me

## දැනුම වැඩුම

මමී (මිනී) දවටා තිබි බැන්ඩේජ් පටිවල ආලේප කොට තිබුනු ලාටු තමන් 'මමියා' යනුවෙන් හඳුන්වන ලද තෙල් වර්ගයක් යය් සිතූ අරාබි ගවේශකයින් නිසා ඒ මිනී "මමී" යන නම් ලැබීය.

ඉතාලියේ ඇල්ප් කඳුකරයේ අය්ස් අතර සුරැකී තිබුනු මිනිසක්, ක්‍රි.ව. 1991 දී සොයා ගන්නා ලදි. එයින් වසර 5300 කට පමන පෙර පිටට අනින ලද ඊයකින් මිය ගිය එකකුගේ බවත්, දැනට සොයාගෙන ඇති, අනෙකකු අතින් මැරුම් කන ලද ආදිතමයාගේ මිනිය බවත් කියති.

- විකසිත -





නොවැළැක්විය හැකි හේතුමත
ඩී බී කුරුප්පු ශූරීන්ගේ
## කස්තිරම
මෙවර පළ නොවන බව කරුණාවෙන් සළකන්න





# විජය පුවත රාජාවලියෙන් ඉගෙන ගනිමු

(මෙය පොතේ ඇති සැටියටම ලියූවකි)

(.. බැලි වෙසින් ඇවිත් නිරිඳුන්ගේ පය ඉඹලා වෙණිය ගසා නොසිට ගියාය)

මෙපුර ගමක් ඇත කියා සෙබළුන් ඇරිය විට කුවේණි ගිය ගියවුන් අල්ලා නෙළුම් පත් යට සඟවා උන්නාය. සෙබළුන් නා බව දැක රජ පිරිත් හුය කර ලමින් කගය අතටගෙන විල් තෙරට බැස සිටි විට බැසපු පිය මිස ගොඬනැඟි පියවර නුදුටුවෙන් නිරිඳු සිතට දුක් බිය වැද උන්නු විට නුග සෙවණේ ඉඳ කපු කටින රන්ලියක් සේ ඉඳිනා යකින්නිය දැකලා මගේ යොධයන් මෑ විසින් කන ලදහයි සිතා ඈ ළඟට ගොස් යෝධයන් කොයි දැයි කියා අල්ලා ඉස කෙස් පටලා කෝ (තෝ) මාගේ යොධයන් කියවයි කී විට මා නොමරවයි කියා මා බිසෝ කර ඉඳිතොත් සත්සියයක් යොධයන් දෙමැයි කී විට දිවුරුන් දෙවයි කී විට ළමැද තනය ගිවිස්වා දිවුරුන් දුන්හ. මේ ශ්‍රී ලංකාව ඉසි බිජුව යන්ඩත්, සවුවිල්ම යන්ඩත්, බඩුපලදව ඇට ආදිට බොල්ව යන්ඩත් මෙබස් තුන කියා දිවුරුන් දී නුඹ හැර අන් බිසවක නොගනිම් කියා දිවුරුන් දුන් සඳ සත් සියයක් යොධයන් ගෙන රජුට පාවා දී තම්මැන්නා අඩවිය විමන කරවා වසන් කර තිබු වී සාල් පොල් ගෙන යොධයන්ඩත් රජුන්ඩත් කවා රෑ ඒ විමන සැතපී උන් කල එද රෑ ලොග්ගල යකෙකුට ලග්ගල යකින්නක් ගෙනෙන මඟුල් ගෝසාව රාත්‍රියේ කෝලාහල මේ කිමෙක්දැයි මේ පුර කෝලාහල කුවේණිය අතින් ඇසු විට ලග්ගල යකුට ලොග්ගල යකින්නක් ගෙනෙන මඟුලකැයි කීහ. එවිට විජය රජ කියන්නේ මෙසේ යකුන් ඇති රට අපට ඉඳිනු බැරිය කී සඳ කුවේණි කියන්නේ මම වෙළඹ වෙසක් මවාගෙන රජු පිට ඉඳුවා ගෙන යකුන් කොටා මරම් කියා නිරිඳුට කීහ. උදෑසන වෙළඹ වෙස් මවා ගෙන නිරිඳු පිට ඉඳුවා ගෙන සත්සියයක් යොධයන් පිරිවරා ගෙන මඟුලට රැස් වු යකුන් කොටා මරවමින් සිරිවත්පුර උරිරු වතුරු එලවමින් යකුන් වනසා තම්මැන්නා නුවරට වැද කුවේණිය බිසව කර ඉඳිනා සඳ යොධයන් සත් සියය රැස්ව වැඳ ඔටුනු පලඳින්ඩ කී සඳ යකිනිය සමග ඉඳ බැරිය කී සඳ පඬිරජුට මිණි පඬුරු ඇර බිසෝ කෙනෙකුන් හා සත්සියයක් ගෑනු පිරිවර ද පංච කර්මාන්ත වැඩ කාරයින් ද ගෙන්නවා..."

(අකුරක් පිල්ලක් අඩු වැඩි නොකර මෙය පිටපත් කරන ලද බව සලකන්න)

1. කුවේනිය, පිරිත් පැන් ඉසින ලද සත් සියයක් සෙබලුන් බිය ගන්වා ඔවින් විල මැදට දක්කා ගෙන ගිය නිසා ඔවින් විලට බට පියවර සටහන් පමනක් පෙනෙන්නට තිබිනි.

2. යෝදයින් සත් සියය යටත් කර ගත් කුවේනියට විජයයන්ට යටත් වීමට සිදු වුයේ ඔවින්ගේ කරෙහි වු පිරිත් නුල නිසා විය යුතුය.

3. "...යැකින්නිය දැකලා .. මගේ යොධයන් මෑ විසින් කන ලදහයි සිතා ..." මේ කියමන අනුව කුවේනිය යැකින්නක බව විජයයන් දැන සිටි බව පෙනේ.

4. අප " මේස් දෙක පල්ල" කියා දිව්රුම් දෙන විදියටම යැකින්න "මේ ලැමද තණෙ පල්ල" කියා මුර්දජ "ළ" වෙනුවට දන්තජ "ල" යන්නත්, දන්තජ "නේ" වෙනුවට මුර්දජ " ණෙ" යන්නත් කියන්නට ඇත. එවිට ඒ දිව්රුම තේරුමක් නැති එකක් වේ.

5. "මේ ශ්‍රී ලංකාව ... බොල්ව යන්ඩත් මෙබස් තුන කියා දිවුරුන් දී..." මේ කොටස තේරුම් ගැනීමට අපොහොසත් වෙමි.

6. කුවේනිය යැකින්නක බව මුල සිටම දැන සිටි විජයයන් "යකුන් ඇති රට ඉඳිනු බැරිය" ය් කීම විහිලුවක් නොවේද ?

7. "නුඹ හැර අන් බිසවක නොගනිමියි දිව්රුම් දුන් විජයයෝ මහ බොරුකාරයෝ වෙති.

වි. ක.ධර්මබන්ධු